# 4 වන පාඩම

## අපි අපේ ආගමේ මුලධර්ම අභිවෘද්ධි ආලේපය තුළින් දැනගෙන, ඒවා තුළින් මිනිස් වටිනාකම් දියුණු කර ගනිමින්, ජීවිතයේ සන්තෝෂය අත්දකිමු.

- අපි අපේ ආගමෙන් සතුට ලබා ගන්නේ කොහොමද?
- මම කාර් එක පදවනවා, මම දන්නවා මගේ කාර් එකේ ඉස්සරා හා පිටුපස ආසනවල සිටින අය. මම එළවගෙන යන පාර කුමක්ද? මම කොහොමද මගේ කාර් එක අරගෙන යන්නේ?
- මගේ කාර් එකේ රෝද හතර සමානයි අපේ ආගමේ තිබෙන ප්‍රධාන මුලධර්ම වලට.
- මගේ කාර් එකේ එන්ජිමේ ඔයිල්, වතුර හා අනෙකුත් යාන්ත්‍රික දේවල් නැත්නම් යන්නේ නෑ. ඒවාට සමාන මගේ ආගමේ මොනවද තිබෙන්නේ?

### 1. ප්‍රධාන මුලධර්ම

අපි අපේ ආගමේ ප්‍රධාන මුලධර්ම හතරක් ගැන කල්පනා කරමු. ඒක හරියට මම පදවන කාර් එකේ රෝද හතර වගේ.

### 2. අපේ විශ්වාසය

විශ්වාස ලක්ෂණය, කිසිම පොතකින් නෙමේ අපිට ආවේ දැන් අපේ පොත්වල තිබුණාට මෙම යාච්ඤාව. සුවිශේෂකවරු හතර දෙනා පොත් ලියන තෙක් මුද්‍රණ තාක්ෂණය එනතෙක් මේ ආගමේ සිද්ධාන්ත, සාමාන්‍ය මිනිසුන්ට වන අපට පරම්පරාවෙන් පරම්පරාවට අපට කියා දුන්නේ මේ යාච්ඤාවෙනි. මේ යාච්ඤාවෙන් අපි කොහොමද අපේ දෙවියන් වහන්සේව විශ්වාස කරන්නේ කියලා කොටස් දොළහකින් බොහෝම සරලව මතක් කර දෙනවා. ඉතින් මින්පසු විශ්වාස ලක්ෂණය කියද්දී මේ කොටස් 12න් කියන්නේ මොනවද කියලා හැම මොහොතකම මතක් කරගන්න ඕනා. දැන් අපි කටපාඩමෙන් මේ යාච්ඤාව දන්න නිසා එය උච්චාරනය කරද්දී නිකම් සතෙක් කෑගහනවා වගේ නැතුව හොඳ අවබෝධයකින් භක්තියකින් කියන්න ඕනේ. මේ සරල කරුණු 12 හොඳට මතක් කර ගන්න ඕනේ. නැත්නම් අපගේ විශ්වාසය නැති වී යනවා. මගේ කාර් එකේ එක රෝදයක හුලං බහිනවා.



හුලං නැති රෝදයක් විශ්වාසය නැතිකම

**විශ්වාස ලක්ෂණය**

1 2
අහස පොළව මැවූ සර්වබලධාරී වූ පිතාවන දෙවියන් කෙරෙහි ද, ඔහුගේ ඒක පුත්‍ර වූ අපගේ ස්වාමීන් වන ජේසු ක්‍රිස්තු තුමන් කෙරෙහි
3 4
ද, විශ්වාස කරමි. මොහු ස්ප්‍රීන්තු සාන්තු විසින් ගැබ වැස කන්‍ය මරිය තුමන්ගෙන් උපන්නාහ. පෝන්සියු පිලාත් හට යටහත්ව වඳ විඳ
5
කුරුසියේ ඇණ ගැසුම් කා උකුත් වී තැන්පත් කරන ලද්දාහ. පාතාල වලට බැස තුන් වනදා මලවුන් කෙරෙන් උත්ථාන කර වදාළා
6 7
පරමණ්ඩල වලට බැස සර්ව වල්ලවූ දෙව් පියාණන්ගේ දකුණු පසෙහි වැඩ සිටින්නාහ. එහි සිට ජීවතුන්ටත් මලවුන්ටත් නඩු වදාරන්නට
8 9 10
වඩිත්මය. ස්ප්‍රීන්තු සාන්තු කෙරෙහි ද, සාදාරණ සාන්ත සභාවේ ද, සාන්තු වරයන්ගේ සමෝස ධර්ම ලාභයෙහි ද, පාප ක්ෂමාවෙහි ද,
11 12
මාංශ උත්ථානයේ ද, අනන්ත ජීවිතයෙහි ද විශ්වාස කරමි. ආමෙන්!



**අපි තවත් රෝදයක් බලමු.**

### 3. අපි කොහොමද දෙවියන්ට වන්දනා කරන්නේ

අපි දැන් දන්නවා මෙය සක්‍රමේන්තු 7කින් සමන්විත මෙය කොටස් 3කින් අපට තේරුම් ගන්න පුළුවන්. අපි කතෝලිකයෙකු වීමට ප්‍රසාද ස්නාපනය, අභිවෘද්ධි අලේපය තුළින් අපි අපේ ආගමේ ළදරුවෙක් හා වැඩිහිටියෙකු වෙනවා. දිව්‍ය සත්ප්‍රසාදය තුළින් අපි අපේ ආගමෙන් දෙවියන්ගෙන් ශක්තිය ලබා ගන්නවා ජීවිතය සන්තෝෂයෙන් ගෙවන්න.



දෙවියන්ට වන්දනා කරන්න දන්නේ නැතිකම.

**3.2** අපේ කතෝලික ආගම පරම්පරාවෙන් පරම්පරාවට ගෙනිහින් මිනිසුන්ට තමන් කාගේ තීරණයෙන්ද ආවේ කියලා කියා දීලා ඒ තුළ තමාගේ ජීවිතය සතුට අත්දකින්න ගන්නාවු ක්‍රියා මාර්ග දෙකයි. විවාහ බන්ධනය හා පුජාත්වරය.

විවහයක් තුලින් අපි ළමයින් උපදවන්නේ නැතිනම් පරම්පරාවල් ඉස්සරහට යන්නේ නෑ. බලන්න අපේ ගෙදර කොයි තරම් ලස්සනද. අම්මා, තාත්තා, අයියලා, අක්කලා, මල්ලිලා, නංගිලා එගොල්ලන් නැතුව අපිට සන්තෝෂද? ඉතින් අපේ ආගමේ විවාහය පිරිමියෙකු හා ගැහැණියක් අතර බන්ධනය මොනම හේතුවකින්වත් ලිහන්න බෑ. ඉතින් විවාහ වුණොත් සන්තෝෂයේදී මෙන්ම මොන කරදරේ ආවත් අපට වෙන්වන්න බෑ. කාගේ වරදින් කියලා හිතුවත්. ඉතින් අප විවහ වන විට මේවත් කතෝලික සභාවෙන් නැවත මතක් කර දෙනවා.



පවුලේ සමාජිකයන් සියල්ලන්ම සමඟ එකට ආහාර ගැනීම. කොතරම් සන්තෝෂද?



පුජාත්වරය අපේ ආගමේ අපෝස්තුරුවරු දොළොස් දෙනෙක් සිටියා. දේව මෑණියොත් ජේසු තුමාගෙන් පසු සෑම දෙයකටම සහභාගි වුණා. දේව මෑණියන් කළේ එක් කර්තවයක් අපෝස්තුරුවරුන් කළේ තව කර්තවයක්. ඉතින් අපි පරම්පරාවට මේ දේව කාර්ය වැඩ කටයුතු කරගෙන යන්න කතෝලික පිරිමියෙක් පුජක දිවියට ගන්නවා. ඔවුන්ට විවහ විය නොහැකියි. ඇයි මොකද වෙන ආගම්වල එහෙම නෑ නේද? ඔවුන්ට මතක් කර දෙනවා ඒ අයගේ ප්‍රධාන කාර්ය දේව රාජ්‍ය සඳහා ජීවත් වීමයි. ඉතින් ඒ අයට විශේෂ පුහුණුවක් ලබා දෙනවා. ඉතින් අපේ ආගමේ පුජකවරු, සහෝදරවරු, කන්‍යා සොහොයුරියන් සියල්ලන්ම එකම සේවයක් කරනවා. අපිත් ඒ වගෙයි. අපේ ආගමේ පංති භේදයක් තිබෙන්න බෑ. මෙයා ලොක්කා අරයා සොක්කා කියන්න බෑ. හැබැයි අද ලංකාවේ එහෙමද දන්නේ නෑ නේද? ඔබට හිතන්නේ කොහොමද? ඉතින් අප කිසිම පංති භේදයකින් තොරව ජීවත්වන හැම දෙනාටම, හැම මිනිසෙකුටම එක ආකාරයෙන් ගරු කරමු. නමුත් වන්දනා නොකරමු.



දේව මෑණියන්



අපෝස්තුරුවරු

අපි දෙවියන්ට වන්දනා කරන එකේ වැදගත්ම අපේ ජීවිතයේ කළ යුතු ප්‍රධාන ක්‍රියාකාරකම තමයි. තමුන් හරිද වැරදිද කියලා තමුන්ගේ ආගමේ මුලධර්මවලට අනුකූලව සිතා, තමුන් වැරදි නම් පාපොච්චාරනය කිරීමත්, අනිත් කෙනා වැරදි නම් ඒ අයට සමාව දීමත්ය.

අපි දෙවැනි පාඩමේ ඉගෙන ගත්තා අපි පුරුදු වෙලා තිබෙනවා රැවටිල්ල හා අනුන් විනිශ්චය කිරීම යන දෙකටම. අපි හිතනවා මේ දෙකම හරි කියලා. අපි පාපොච්චාරනයෙන්වත් මේවා වැරදි කියලා හිතන්නේ නෑ. බලන්න සුවිශේෂයේ මේ ගැන මොනවද තියෙන්නේ කියලා.

## 3.3 අනුන් විනිශ්චය

**අනුන් විනිශ්චය කිරීම. (ලූක් 6:37 - 38, 41 - 42)**

"විනිශ්චය නොකරන්න; එවිට ඔබ ද විනිශ්චය කරනු නොලබන්නෙහි ය. ඔබ දෙන විනිශ්චයෙන්ම ඔබත් විනිශ්චය කරනු ලබන්නෙහිය. ඔබ මනින මිම්මෙන්ම ඔබටත් මැන දෙනු ලැබේ. ඔබේම ඇසේ ඇති ලී කොටය ගැන නොතකා ඔබේ සහෝදරයාගේ ඇසේ ඇති ලී කුඩ ගැන බලන්නේ මන්ද? නොහොත් ඔබේම ඇසෙහි ලී කොටය තිබියදී සහෝදරයාට කතා කොට ඔබේ ඇසේ තිබෙන ලී කුඩ පහ කරන්න ඉඩ දෙන්නැයි ඔහුට කියන්නේ කොහොමද? කෛරාටිකය, පළමු කොට ඔබේ ඇසින් ලී කොටය පහ කරන්න. එවිට සහෝදරයාගේ ඇසෙන් ලී කුඩ පහ කරන්න ඔබට හොඳින් පෙනෙනු ඇත."

"පූජනීය දේ බල්ලන්ට නොදෙන්න. ඔබේ මුතු ඇට ඌරන් ඉදිරියෙහි නොදමන්න. එසේ කළොත්, උන් ඒවා පයින් පාගා දමා හැරී අවුත් ඔබ කැබලි කොට ඉරා දමනු ඇත."

මොකද මේ බල්ලෝ ඌරෝ ගැන කතා කරන්නේ. එය හරිද වැරදිද? අපේ අරමුණ නරක නම් අපි තිරිසෙනෙක් වෙනවා. සතා හා තිරිසනා අතර වෙනසක් තිබෙනවාද? (ඉංග්‍රීසි භාෂාවෙහි සතා හා තිරිසනා ගැන කියවන්නේ කොහොමද?

ඉතින් අපේ ආගමේ දෙවියන්ට වන්දනා කරන්න තියෙන අන්තිම ක්‍රියාකාරකම තමයි, රෝගීන්ගේ ආලේපන. අපි දෙවියන්ගේ තීරණයෙන් මේ ලෝකයට ආවේ ඉතින් දෙවියන් වහන්සේට කැමති වෙලාවක අපේ කාර් එකේ පෙට්‍රල් නවත්වන්න පුළුවන්. ඒවා ගැන හොයාගන්න සාස්තර, හොඳ වෙලාවල්, පේන බලන්න යන්න එපා. අපිව මේ ලෝකයට එවන්න තීරණය කළ කෙනාට තමයි මේ ලෝකයෙන් කවදාද ගන්නේ කියලත් තීරණය කරන්නේ. ඉතින් මේ ලෝකයේ ජීවත් වෙද්දී අපට මානසික හා කායික අසනීප හැදෙනවා. ඒ වෙලාවේදී දෙවියන් වහන්සේ කියලා තිබෙන්නේ බේත් අරගෙන, ඒ එක්කම පුජකතුමන් හරහා රෝගීන්ගේ ආලේපය ලබා ගන්න කියලා. බෙහෙත් නොගෙන එසේ කිරීමෙන් අපි අපේ වෛද්‍ය විද්‍යාව දියුණු කරන්නේ නෑ. ඒ එක්කම තවත් කෙනෙකුගේ උදව්වක් (වෛද්‍යවරයාගේ) අපි බලාපොරොත්තු වන්නේ නෑ. අපි නිතරම කම්මැලි කමට දෙවියන්ගෙන් උදව් බලාපොරොත්තු වෙනවා. අපේ ආගමේ කම්මැලි අයට ජීවිතයේ සන්තෝෂය අත්දකින්න බෑ. බලන්න මාළු ප්‍රාතිහාරය.

### පන්දහසකට කන්ට දීම ( ශු.මතෙව් 14. 16-21 )

ඔවුන් යන්ට කමක් නැත; නුඹලා ඔවුන්ට කන්ට දීපල්ලායි යේසුස් වහන්සේ ඔවුන්ට කීසේක. ඔව්හුද: අපට මෙහි තිබෙන්නේ රොටි පහකුත් මසුන් දෙදෙනෙකුත් පමණක්යයි උන්වහන්සේට කීවෝය. ඒවාමෙහි මා වෙතට ගෙනල්ලායයි උන්වහන්සේ කීසේක. උන්වහන්සේ සමූහයාට තණකොළ පිට හිඳගන්ට අණකොට, රොටි පහත් මසුන් දෙදෙනත් රැගෙන, ස්වර්ගය දෙස බලා ආශිර්වාදකොට, රොටි කඩා ගෝලයන්ට දුන්සේක. ගෝලයෝද සමූහයන්ට දුන්නෝය. සියල්ලෝම කා තෘප්තියට පැමිණියෝය. ඔව්හු කැඩු කැබලිවලින් ඉතිරි ඒවා එක්කොට පැස් දෙළොසක් පුරවාගත්තෝය. ස්ත්‍රීන්ද දරුවන්ද හැර කෑවාවු පුරුෂයෝ පන්දහසක් පමණ වූහ.

සුවිශේෂකවරු හතර දෙනාම ලියලා තියෙන්නේ ජීවත්වෙද්දී කොහොමද අපි ජීවිතය හොඳ අරමුණ සඳහා මොන ක්‍රියාද කරන්න ඕනේ කියලා. එහෙම කරලා ජීවිතය සන්තෝෂයෙන් ගෙනයන්න තමයි කියන්නේ. බලන්න දෙවියන් වහන්සේ පරණ ගිවිසුමේ වගේ මන්නා වැට්ටුවේ නෑ නේද! ඒ වෙනුවට තමාගේ හැකියාවන් (මාළු) තියෙන එක්කෙනෙක්ව හොයා ගත්තා. ඒ හැකියාව තිබුණ කෙනා කිසිම කුඩුකේඩුවක් නැතුව දෙවියන් කෙරෙහි විශ්වාසයෙන් තමන්ගේ හැකියාව සැපයුවා. මොනවද එහෙම කරපුවම එයා දැක්කේ? ප්‍රාතිහාර්යයක්! ඉතින් අපි අපගේ කාර් එකේ තුන්වන රෝද ගැන කල්පනා කෙරුවා. ඒ කරුණු හරියට දැනගෙන වැඩ නොකළත් දෙවැනි රෝදයේත් හුලං නෑ නේද? මේ රෝදය ඉස්සරහට දාමුද? පස්සට දාමුද?



**අපි තව රෝදයක් බලමු.**

### 4. අපි කොහොමද ජීවත් විය යුත්තේ

අපේ ආගමේ දස පණත හොඳටම දැනගෙන, අපේ අරමුණු ක්‍රියා, මේ දස පණතේ තිබෙන කරන්න ඕන ක්‍රියාවලට පටහැනිද කියලා දැනගත යුතුය. එසේ පටහැනි නම් නැවත නොකරන්න සිතාගෙන පියතුමෙක් හමුවී පාපොච්චාරණය කළ යුතුයි.

අපි කොහොමද ජීවත් විය යුත්තේ කියා නොදන්නාකම නිසා

**<u>දස පණත</u>**

1. සැබෑවූ එකම දෙවියන්ට වන්දනා කරව.
2. දෙවියන්ගේ ශ්‍රී නාමය ගැන බොරුවටත් නිරන්තරයටත් නොදිවිරව.
3. ඉරුදිනත් ණය මංගල්‍ය දිනත් නිවාඩු වලංගු කරව.
4. මව්පියන්ට සංග්‍රහ කරව.
5. ජීවිත විනාශ නොකරව.
6. කාම මිත්‍යාචාරය නොකරව.
7. සොරකම් නොකරව.
8. බොරු සාක්ෂි නොකරව.
9. පරදර ආලය නොකරව.
10. අන් වස්තු ආශා නොකරව.





දස පණත

**අපි තවත් රෝදයක් බලමු.**



### 5. අපි කොහොමද දෙවියන් සමඟ සම්බන්ධතා පවත්වන්නේ?

දෙවියන් සමඟ සම්බන්ධතාවයක් නැතිවීම

දෙවියන් සමඟ සම්බන්ධතා අවශ්‍යද? උන්වහන්සේගේ තීරණයෙන් අපි මේ ලෝකයට ආවා නම්, උන්වහන්සේ අපේ අවශ්‍යතා දැනගෙන අපට ලබා දෙන්න එපාද? අපි උන්වහන්සේගෙන් ඉල්ලන්නම ඕනාද? නැත්නම් උන්වහන්සේ එක්ක කතා කරන්න ඕනාද? ඒ වගේම උන්වන්සේ අපිව මේ ලෝකයට එව්වා නම් ඇයි අපේ දෙමව්පියන් හරහා එව්වේ? කෙළින්ම අපව මවන්න තිබුණා හරියට ආදම් සහ ඒව වගේ. එතකොට ඔබට කල්පනා කරන්න වෙනවා මේ ලෝකයේ සන්තෝෂයෙන් ඉන්න, ලස්සන, ආදරය අත්දකින්න යම් කිසි ක්‍රමවේදයක් තිබෙනවාද කියලා. ඔබට පාසලේදී ගුරුතුමා අභ්‍යාසයක් කරන්න කියන්නේ ඇයි? කළොත් ගුරුතුමා සන්තෝෂද? ඒ ඉගැනීම තුළ ඔබත් සන්තෝෂ වෙනවද? ප්‍රශ්නයක් ඇති වුණොත් ඔබ ගුරුතුමාගෙන් අහනවද? එතකොට අපි ජීවත් වෙද්දී සෑම මොහොතකම අපේ තාත්තාගෙන් අම්මාගෙන් අහනවා අපි මොකද කරන්න ඕනේ කියලා. ඉතින් අපිට මේ ලෝකයේ ජීවත් වෙද්දී මේ ලෝකයට අපිව එවපු කෙනා සමඟ සම්බන්ධවෙන්න ඕනා. ඒකට තමයි ස්වර්ගයේ වැඩ සිටින යාච්ඤාව තිබෙන්නේ. ඉතින් අපි එයින් අපට වැටහෙන්නේ මොනවාද කියලා හොඳට කල්පනා කරලා බලන්න. කවුද මේ යාච්ඤාව නිර්මාණය කළේ? ජේසු තුමායි. එයයි එහි වැදගත්කම. මේ යාච්ඤාව සුළු හැඳින්වීමකින් හා ඉල්ලීම් හතකින් (7) සමන්විතයි. මොනවාද මේ ඉල්ලීම්? ඔබය වැටහෙනවාද බලන්න. මීට අමතරව අපි දෙව්මව් හා සාන්තුවරයන් හරහා දෙවියන් සමඟ සම්බන්ධතා පවත්වනවා. මොකද අපිට තව පාර්ශවයක් ඔවුන් දෙවියන් සමඟ සම්බන්ධ වෙන්න. හරි නෑ නේද? අපි කෙළින්ම කතා කළොත් හොඳයි නේද?



**පරමණ්ඩල ආරාධනාව.**

ස්වර්ගේ වැඩ සිටින අපගේ පියාණනී, [1] <u>ඔබගේ ශ්‍රී නාමයට ප්‍රශංසා වේවා</u>. [2] <u>ඔබගේ රාජ්‍යය පැමිණේවා</u>. [3] <u>ඔබගේ කැමැත්ත ස්වර්ගයේ මෙන් මෙලොවෙහිද ඉටු වේවා</u>. [4] <u>අපගේ එදිනෙදා භෝජනය අද අපට දානය කළ මැනව</u>. [5] <u>අපට වරද කරන අයගේ වැරදි අප කමා කරන්නාක් මෙන් අපගේ වැරදිද කමා කළ මැනව</u>. [6] <u>පාප අවස්ථාවන් වලට අසු වීමට අපට ඉඩ නොදී</u> [7] <u>අයහපතින් අප මුදා ගත මැනව.</u>

බලන්න මගේ යාළුවාගේ තාත්තාව සැත්කමක් කරන්න වෙලා. යාළුවා ඇවිත් මට කියනවා "මගේ තාත්තා වෙනුවෙන් යාච්ඤා කරන්න කියලා" ඉතින් මමද දොස්තර අර සැත්කම කරන්න ඒ වැඩේට උදව් වෙන්න.

හැබැයි ඔබ සන්තෝෂයෙන් භාර ගන්නවා යාච්ඤා කරන්න. මම සැත්කම කරන දොස්තර නොවුනත්, මොකද මේ වෙන්නේ? මගේ යාච්ඤාව තුළින් මම යාළුවගේ පවුලට සම්බන්ධ වෙනවා. අපි එකම ලොකු පවුලක් වෙනවා. ඉතින් ඒ ආකාරයට අපි එක ලොකු පවුලක් වෙනවා දෙවියන් එක්ක, දේව මෑණියන් හා සාන්තුවරයන් හරහා. ඔබත් උදේ පාන්දර තනිවම TV, පත්තර නොබලා, හොඳ වතුර වීදුරුවක් පානය කරලා ජපමාලය කියන්න බලන්න, ඔබට සන්තෝෂය ඇති වෙනවද කියලා.

සමහර විට අපිට ටිකක් අවබෝධ කරගන්න පුළුවන් ඉටිපන්දමක් ගැන හිතලා. එහි තිරය ඔබේ ජීවිතයයි. ඔබගේ ජීවිතයේ සන්තෝෂය ඉටිපන්දමේ දැල්ලයි. ඇත්තෙන්ම ඉටි අවශ්‍යද ඔය දැල්ල පත්තු වෙන්න? තිරය විතරක් තිබුණොත් ඇති නේද? හරියට ඉටි දේව මෑණියන් වගේ. ඉටි වැඩි වෙන්න වැඩි වෙන්න දැල්ල ලොකුයි. සන්තෝෂය වැඩියි. ඉතින් දේව මෑණියන් ගැන දැනගත්තොත් හොඳයි නේද?

සමහර ක්‍රිස්තියානි අය මේ ගැන පටලවාගෙන නේද? ඒ අයට දේව මෑණියන්ගෙන් අපිට අපේ ජීවිතය, දෙවියන් ගැන අවබෝධයක් ලැබීමට අපිට අත්වැලක් වෙනවා. අපේ අවබෝධය මදියි වගේ නේද?

## බලන්න දේවමෑණියෝ තුළින් අපිට අපේ ජීවිතයේදී දෙවියන් කවුරුද කියලා අත්දකින්න පුළුවන්ද කියලා?



1. ගාබ්‍රියෙල් දේව දූතයා හරහා දේව මෑණියන්ගේ කැමැත්ත, ජේසු තුමා බිහි කරන්න දෙවියන් වහන්සේ ලබාගත්තා - අපේ නිදහස් කැමැත්ත කොහොමද පාවිච්චි කරන්න ඕන කියලා හිතලා බලන්න. දෙවියන් වහන්සේ අපේ නිදහස් කැමැත්තට බාධා කරනවාද? හොඳ හෝ නරක දේවලට වුනත් නෑ.

2. දේව මෑණියෝ ජේසු තුමා බිහි කලේ ගව මඩුවක - එතුමිය දෙවියන් වහන්සේ ගැන නෝක්කාඩුවෙන් කතා කලේ නෑ, එතුමියට කරපු වැඩේ නරකයි, මෙහෙම කරදරයෙන් ජේසු තුමා බිහි කරන්න වෙයි කියලා (දෙවියන් වහන්සේට සියල්ල කළ හැකි නිසා)



3. ජේසු තුමා ඉපදුන ගමන්ම හෙරෝද් පොඩි ළමයින්ව නැතිකරන්න ගත්තා - දේව මෑණියෝ දෙවියන්ගෙන් ඉල්ලුවේ නෑ හෙරෝද්ව නැති කරන්න කියලා. ඒ වෙනුවට එතුමිය හා ජුසේ තුමා ජේසුතුමාවත් අරගෙන යනවා ඊජිප්තුවට. නෝක්කාඩු කිව්වද දේව මෑණියෝ?

4. ඊජිප්තුවේ ඉඳන් ජෙරුසලෙමට එන්න ජුසේ තුමාට කියනවා. මගදී ජුසේ තුමාට තේරෙනවා එහෙම ගියොත් කොට උඩ කියලා. ජුසේ තුමා බැන්නද දෙවියන්ට මාව ගඟේ ගෙනියනවා කියලා? ඒ වෙනුවට එතුමා හා මරිය තුමිය නාසරෙත් බලා යනවා. ඒගොල්ලෝ නෝක්කාඩු කිව්වද දෙවියන් වහන්සේට? නෑ!



5. ජේසු තුමාගේ ප්‍රසිද්ධ ජීවිතයේදී දේව මෑණියෝ යනවා ජේසු තුමා බලන්න. ජේසු තුමා කියනවා "කව්ද මගේ අම්මා, සහෝදරයෝ මේ ඕගොල්ලොයි" කියලා. හරියට දේව මෑණියන්ට සවුත්තුවට වගේ. අපේ අම්මට මේ වගේ අපෙන් වුණොත් මොනව වෙයිද? දේව මෑණියෝ ජේසු තුමන්ට නෝක්කාඩු කිව්වද? නෑ නේද?



6. කුරුස ගසේදී ජේසු තුමා දේව මෑණියන්ට අපි ඔක්කොම භාර දෙනවා. එදා ඉඳන් එතුමිය අපේ අම්මා වුණා. ඊට පස්සේ දේව මෑණියෝ අපෝස්තුළුවරු දොළොස්දෙනාගේ නායකයා වුණාද? නෑ නේද? එතුමිය නායකයා වෙන්න ගියාද? අපිට එහෙම වුණොත් අපි මොනවද කරන්නේ?



7. ජේසු තුමා ස්වර්ගාරෝහණය වුණාට පස්සේ දේව මෑණියෝ ගෝලයෝ එක්ක හිටියද? ඔව් නේද? කව්ද ඒකේ ලොක්කා? පේදුරු උන්වහන්සේ. දේව මෑණියෝ කවල් ඇද්දද මම ලොක්කා වෙන්න ඕනේ කියලා? නෑ නේද? එතුමිය අපේ ආගමේ තියෙන ප්‍රධාන මූලධර්මය වන දෙවියන්ගේ කැමැත්ත අපට තේරුම් කර දෙන ප්‍රධාන කැඩපතයි. ඉතින් අපි එතුමිය ගැන දැන නොගත්තොත් දෙවියන් කෙරෙහි තියෙන විශ්වාසය (අර ටයර් එක) අපි ජීවත් වෙද්දී අපේ ප්‍රශ්න වලට මුණ දෙන ක්‍රම ගැන ලොකු අවබෝධයක් ලබා ගන්න උදව් වෙනවා. එහෙම කෙනෙක් ගැන දන්නේ නැති ක්‍රිස්තියානි ආගමෙන් සමහර විට අපිට අපේ ජීවිතයේ සන්තෝෂය ලබා ගන්න පහසු මාර්ගය ලැබෙන්නේ නැති වෙන්න පුළුවන්. අපි ජීවිතය පදවගෙන යද්දී අපේ කාර් එකේ ටයර් එකේ හුලං අඩු වේගෙන යන්න පුළුවන්. එක ටයරයක හුලං ගියොත් කාර් එක හයියෙන් දුවන්න පුළුවන්ද?

## අපේ විශ්වාසය වැඩි කර ගන්න දේව මෑණියෝ මේ මෑතකදී කළ දේවල් ඔබ දන්නවාද?

1833 - ශු. කැතරින් ලැබොරේ තුමියට දර්ශනය වෙලා කිව්වා පුදුම පදක්කම බොරලික්කම කරේ පළඳ ගන්න කියලා. දේව මෑණියන්මයි ඒ පදක්කම සාදන්න ඕන ආකාරය කියලා දුන්නේ.

අදත් ශු. කැතරින්ගේ ශරීරය නොදිරා බොහෝම ලස්සනට (පණපිටින් ඉන්නවා වගේ) පැරිසියේ තිබෙනවා. ඉතින් ඔබත් මෝඩද? පුදුම පදක්කම බොරලික්කම නොපැළඳ ඉන්න.

1860 - ප්‍රංශේ ලූර්දු නුවර බර්නදෙත් තුමියට දර්ශනය වුණා. අපේ පව් වලට දුක් වෙන්න කිව්වා. ජපමාලය කියන්න කිව්වා.

අදත් ශු. බර්නදෙත් තුමියගේ නොදිරන සිරුර ප්‍රංශයේ නොවෙඅ කන්‍යාරාමයේ තිබෙනවා. ඉතින් ඔබත් ජපමාලය කිව්වොත් හොඳයි නේද? නොවෙඅ නගරයට ගොස් ඒ ලස්සන නොදිරන ශරීරය බැලුවොත් හොඳයි නේද?

1917 - පෘතුගාලයේ පැටිමා නගරයේදී දේව මෑණියෝ දර්ශනය වුණා. හැම පළමු සෙනසුරාදාවකම පාපොච්චාරණය කර දිව්‍ය සත්ප්‍රසාදය ලබා ජපමාලය කියන්න කිව්වා. ඒ අතර ජපමාලයට තව අලුත් යාච්ඤාවකුත් ඇතුළත් කළා. තවම අපි දන්නේ නෑ ලුසී තුමීගේ ශරීරය දිරලද නැද්ද කියලා. ශු.සභාව නිකම්ම ඒවා හොයලා බලන්නේ නෑ. ක්‍රමවේදයක් තියෙනවා ශුද්ධවන්තයෙක් කරන්න. ඔබ ඒ ගැන දන්නවාද?

ඉතින් දේව මෑණියෝ මේ තරම් ක්‍රම හා ප්‍රායෝගික ක්‍රියා තුළින් අපිට එතුමිය හරහා දෙවියන්ට වන්දනා කරන්න කියා දෙනවා. එතුමියට ගරු කළ යුතුයි. හැබැයි වන්දනා නොකළ යුතුයි. එතුමිය තුළින් අපිට හරි පහසු වෙනවා දෙවියන් වහන්සේව හඳුනා ගෙන ජීවිතය සන්තෝෂයෙන් ගෙවන්න.

ඉතින් ඒ වගේම කතෝලික සභාවෙන් අපිට අපේ ජීවිතය ගෙන යද්දී, පෙර ජීවත් වුණ අපිට හොඳ උදාහරණ ලෙස කල්පනා කරන්න පුළුවන් ජීවිත ගැන එනම් ඔවුන් සාන්තුවරයන් කියලා හඳුන්වා දෙනවා. සාන්තුවරයෙක් කියලා කතෝලික සභාන කියන්න සමහරවිට අවුරුදු සිය ගණනක් ගන්නවි. නිකම් ආවට ගියාට නම් සාන්තුවරයෙක් කියලා කියන්නේ නෑ. ඉතින් ඒගොල්ලන්ගේ ජීවිත දිහා බලලා ඒගොල්ලන් හරහා අපි දෙවියන් වහන්සේගෙන් උදව් ගත්තොත් අපේ ජීවිතය ගෙන යන්න එය අපට හොඳ නැද්ද?

**6.** අපි දැන් අපේ කාර් එකේ රෝද හතරෙම හොඳට හුලං තිබිය යුතු විදිය තේරුම් ගත්තා. එහෙම හුලං තිබුණොත් මගේ කාර් එකෙ කාටහරි තල්ලුවක් හරි දාන්න පුළුවන් ඉස්සරහට යන්න. බලන්න දැන් කාර් එකේ එංජින් එක ඉදිරිපස තිබෙන කොට ඉස්සරහ රෝද දෙකට බර වැඩි නේද? කාර් එක ධාවනය කරද්දී ඉස්සරහ රෝද පිටිපස්සේ රෝදවලට වඩා හොඳට තිබෙන්න ඕනා නේද? එවිට අපේ ජීවිතයෙත් අර ඉස්සරහ රෝද වෙන්නේ අපිට ජීවත් වෙද්දී අමාරු කර්තවයන් කරන්න. ඒ මොනවාද? දෙවියන්ට වන්දනා කරන්න හා දෙවියන් කියපු ආකාරයට ජීවත් වෙන්න. පිටුපස රෝද දෙක ටිකක් ලේසි කරන්න. විශ්වාසය හා යාච්ඤාව. ඉතින් අපේ කාර් එකේ සමහර විට පිටුපස රෝද දෙකේ විතරක් හුලං තිබිලා ඉස්සරහ රෝදවල හුලං අඩුද දන්නේ නෑ. එහෙම හුලං අඩු වුනොත් අපේ කාර් එක නම් හයියෙන් යන්න බෑ නේද? ගියොත් අනතුරකට මුහුණ දෙන්න පුළුවන්. එතකොට අපිට සන්තෝෂය නැතුව යයි නේද?



මගේ කාර් එක

**7. සංවේදිතාව,**

කාර්වල රියදුරු මහත්වරු කතා කරමින් කාර් එක පදවනවා ඔබ දැකලා ඇති. හැබැයි ඔවුන් කතා කරමින් පැදෙව්වට ඔවුන් පාරේ යන වාහන ගැන හොඳට කල්පනාවෙන් තමා යන්නේ. ඒකට අපි කියනවා සංවේදි වෙනවා කියලා. ඔබත් මේ සංවේදිතාවයෙන් ඔබගේ ජීවිතය දියුණු කර ගන්න මොනවද කරන්න ඕනේ. අර අපේ කාර් එකේ රෝද හතර හොඳ වගේම, එංජින් ඔයිල්, වතුර හා අනිකුත් උපකරණ වැඩ කරන්න ඕන. අපි සංවේදි වෙන්න ඕනේ මේ සියල්ලම මගේ කාර් එකේ තිබෙනවායි කියලා. එහෙම කරන්න මුලිකවම මට මගේ ආගමේ මුලධර්මවල් හොඳින් දැනගන්න ඕනේ. නැත්නම් වැඩේ හිට්ලර් වෙනවා. මම හිතනවා මම හරි කියලා. හැබැයි මගේ මුලධර්මවලි වැරදි. අපි කොහොමද මෙය දැනගන්නේ?

**පොඩි කථාවක් බලමු.**



එක නැවක් අඳුරු කුණාටු සහිත මුහුදෙ යද්දි, ඒ නැවේ කපිතාන් දකිනවා තව නැවක් එයාගෙ නැවේ හැප්පෙන්න එනවා කියල ඉතින් මේ කපිතාන් ඒ නැවට පණිවුඩ (signal) කරනවා නැව හරවන්න කියලා. අනිත් නැව් කපිතාන් කියනවා බෑ කියල, මේ නැවටම හරවන්න කියල වෙන පැත්තකට, ඉතින් මේ නැවේ කපිතාන් අඩිය පොළවෙ ගහල කියනවා මම කොහොමත් හරවන්නෙ නෑ ඔය නැව ඇවිත් හැප්පුනත් කියල. හරි අසාධාරණයි නේද? අනිත් නැවේ කප්පිත්තා. අනිත් නැවේ කප්පිත්තා අන්තිමයට කියනවා "සහෝදරයා මට හැරෙන්න බෑ මම තමා ප්‍රදීපාගාරය" කියලා.(light house). හරියට අපේ ජීවිතයත් මේ වගේ. අපි අපේ නැව පදවගෙන යද්දි අපි හිතනවා හරි විදියටමයි යන්නෙ කියල. අපි අපේ පහන් කණු ගැන අමතක කරල. එහෙම වුනොත් වැඩේ හිට්ලර් වෙනවා.

# ප්‍රශ්න

1) අපි පදවන කාර් එක අඳින්න. එහි අපි ඉන්න තැන, අපේ ගෙවල් වල අය ඉන්න තැන, අපේ යාළුවෝ ඉන්න තැන ලකුණු කරන්න.



2) වැඩේ හිට්ලර් වෙනවා කියන්නේ?

3) අපේ ජීවිතයේ ප්‍රදීපාගාරය කව්ද?

4) ඉටිපන්දමක දැල්ල එන්න නම් ඉටි ඕනේ. අපේ ජීවිතයත් හරියට ඉටි පන්දමේ තිරය වගේ. දැල්ල හරියට අපේ ජීවිතය ගැන අනිත් අයට පේන විදියයි. එතකොට ඉටි වලින් මොනාද කරන්නේ? අපේ ආගමේ මේ ඉටි වලට සමාන කව්ද?

5) අපි එක පවුලක්. ඒක කොහොමද අපේ ආගම තුලින් වෙන්නේ?

6) අපි අභිෂේක ආලේපය තුලින් අපේ ජීවිතය සන්තෝෂයෙන් ගෙන යන්න ස්ප්‍රීතු සාන්තු වරප්‍රසාද අපි ලබා ගන්නවා. එතකොට අපිට රියදුරු බලපත්‍රය දැන් ලැබිලා. ඉතින් මේ අභිෂේක ආලේපයෙන් පස්සේ ඔබගේ යාළුවන්ට මේ කාර් එක පදවන ක්‍රමය ගැන පුහුණුවක් දුන්නොත් හොඳයි නේද? කොහෙමෙද ඔබ ඒක කරන්නේ?

7) පව්කමාව හා සමාව දන්නේ නැත්නම් අපි දෙවියන්ට වන්දනා කරනවාද? ඒක නෙද තුන්වෙනි ටයරයේ අමාරුම කරතව්‍ය? ඔබ කොහොමද ඒක කරන්නේ?

8) අපේ ආගමේ දිව්‍ය සත්ප්‍රසාදය නමැති ප්‍රධාන ආහාරය දෙවියන්ට වන්දනා කිරීම තුලින් ලැබෙන්නේ. වෙනත් ආගම් වල මෙවැනි සරළ කෑම බෙදා ගැනීමක් තියෙනවාද?

9) අපේ ආගම ගැන දැනගන්නනම් මේ කාරය ගැන හොඳට දැනගත්තොත් ඇති නේද? ඔබ කොහොමද මේ කාරය ගැන දැනගෙන අනිත් අයට කියා දෙන්නේ?

10) ප්‍රාතිහාර්ය හා මැජික් එකක් අතර වෙනස කුමක්ද?

11) කොහොමද අපිට අපේ ජීවිතයේ ප්‍රාතිහාර්ය දැන ගන්න පුළුවන් වෙන්නේ? විද්‍යානුකූලයි කියලා හිතලා නිකන්ම තමුන්ගේ හැකියාවන් දියුණු නොකිරීමද? මට නම් තේරෙන්නේ නෑ! හැබැයි මගේ හැකියාවන් දෙවියන් තුළ කළොත් මට ප්‍රාතිහාර්යයන් දැකලා මගේ ජීවිතයේ සන්තෝෂය ලැබෙයිද? කල්කටාවේ තෙරේසා මව්තුමිය මේ වගේ ප්‍රාතිහාර්යයක්ද කළේ? ඔබ ඇය ගැන දන්නවාද? ඔබත් ඈ වගේ වෙන්න කැමතිද?

කල්කටාවේ
තෙරේසා මව්තුමිය





**මේ ගැන හිතන්න**

අපි ඇයි දේව මෑණියන්ට, සාන්තුවරයන්ට ගරු කරන්නේ? ඇයි ඒ අය හරහා දෙවියන්ට යාච්ඤා කරන්නේ? ඇයි අපි අනිත් අය වෙනුවෙන් යදින්නේ? දෙවියන්ට ඒවා තේරෙන්නේ නැද්ද? කාර් එකේ රෝද හතර හොඳ වුනත්, කාර් එක දුවයිද? මොනවද තව ඕනේ?